# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2088/25 - 2018 සැප්තැම්බර් මස 11 වැනි අඟහරුවාදා - 2018.09.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත**

2018 අංක 25 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනතෙන් අවසන් වරට සංශෝධනය කරන ලද, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 58(අ) වගන්තියේ (1) උපවගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මවිසින්, උපලේඛනයේ දක්වා ඇති පරිදි එකතු කළ අගය මත සංචාරක බදු ආපසු ලබාදීමේ ක්‍රමවේදය මෙම නියෝගය මගින් පහත පරිදි නියම කර සිටිමි.

I. (1) වන උපවගන්තියේ (අ) අයිතමය යටතේ ඇති භාණ්ඩ

II. (1) වන උපවගන්තියේ (ආ) අයිතමය යටතේ ඇති භාණ්ඩවල වටිනාකම

III. ආපසු ලබාදීමේ ක්‍රමවේදය

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2018 සැප්තැම්බර් මස 11 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දීය.

උපලේඛනය

**එකතු කළ අගය මත සංචාරක බදු ආපසු ලබාදීමේ ක්‍රමවේදය**

***I වැනි කොටස - (1) වන උපවගන්තියේ (අ) අයිතමය යටතේ ඇති භාණ්ඩ***

පහත සඳහන් භාණ්ඩ හැර සංචාරකයෙකු විසින් එකතු කළ අගය මත බදු ගෙවා මිලදී ගත් භාණ්ඩ සහ ඔහු ශ්‍රී ලංකාවෙන් පිටව යන අවස්ථාවේදී ශ්‍රී ලංකාවෙන් ඉවත් කර ගන්නා එවැනි භාණ්ඩ

I. බෝතල් කළ ජලය

II. වාතනය කළ ජලය

III. පිසින ලද ආහාර

IV. සම්පූර්ණයෙන් හෝ අඩවශයෙන් පරිභෝජනය කළ ඕනෑම භාණ්ඩයක්



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*II වැනි කොටස - (1) වන උපවගන්තියේ (ආ) අයිතමය යටතේ ඇති භාණ්ඩවල වටිනාකම*

සංචාරකයෙකු විසින් එකතු කළ අගය මත බදු ගෙවා මිලදී ගත් භාණ්ඩවල වටිනාකම (එකතු කළ අගය මත බදු රහිතව) සහ ඔහු ශ්‍රී ලංකාවෙන් පිටව යන අවස්ථාවේදී ශ්‍රී ලංකාවෙන් ඉවත් කර ගනු ලබන, රුපියල් පනස් දහසට නොඅඩු, බලයලත් ස්ථිර වෙළෙන්දෙකුගෙන් දිනකට ඉන්වොයිසි තුනකට (03) නොවැඩි වූ එවැනි භාණ්ඩ.

*III වැනි කොටස - ආපසු ලබාදීමේ ක්‍රමවේදය*

එවැනි ඕනෑම වටිනාකමක් සඳහා ආපසු ලබාදිය යුතු ප්‍රමාණය දී ඇති සමීකරණය පදනම් කරගනිමින් ගණනය කළ යුතු ය.

$$\text{ආපසු ලබාදෙන ප්‍රමාණය} = 80\% \ (A \times B)$$

මෙහි,

A - එකත කළ අගය මත බදු ගෙවූ ශ්‍රී ලංකාවෙන් ඉවත් කරගන්නා භාණ්ඩවල වටිනාකම

B - එකතු කළ අගය මත බදු අනුප්‍රමාණය

09 - 718

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.